**ශ්‍රී ලංකාවේ වර්ෂ 2019 ජනාධිපතිවරණය සම්බන්ධයෙන් වන අන්තර්ජාතික ජනරජ ආයතනයෙහි සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි ඒකාබද්ධ දූත පිරිස විසින් ඉදිරිපත් කරනු ලබන ඒකාබද්ධ පූර්ව ජනාධිපතිවරණ නිවේදනය**

**2019 ඔක්තෝබර් 9**

**සාරංශය**

අන්තර්ජාතික ජනරජ ආයතනයInternational Republican Institute (IRI) හා ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය National Democratic Institute (NDI) විසින් සංවිධානය කළ අන්තර්ජාතික ඒකාබද්ධ පූර්ව මැතිවරණ දූත පිරිස විසින් මෙම නිවේදනය ඉදිරිපත් කරනු ලබයි. මෙම දූත මෙහෙයෙහි මූලික අරමුණු වූයේ, ඉදිරි නොවැම්බර් 16 වන දින පැවැත්වීමට නියමිත ජනාධිපති මැතිවරණය සම්බන්ධයෙන් දැනට පවතින පෙර සූදානම පිළිබඳව නිවැරදි සහ අපක්ෂපාතී සමාලෝචනයක් සිදු කිරීම සහ එකී ක්‍රියාවලියෙහි විනිවිදභාවය, සුරක්ෂිතතාවය සහ විශ්වාසනීයත්වයෙන් යුත් මැතිවරණ පැවැත්වීම මෙන්ම ඒ හා බැඳි මහජන විශ්වාසනීයත්වය කෙරේ බලපාන ඉදිරි කටයුතු වඩ වඩාත් දියුණු කර ගැනීම සඳහා උපකාරී වන නිර්දේශයන් ලබාදීමය. තවද ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සාමය යන ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි නියෝජිතයින් විසින් පසුගිය සැප්තැම්බර් මස මුල් භාගය තුල සිදුකරන ලද සියලු දෙනා අන්තර්ගත කිරීම පිළිබඳ ඇගයීමක තොරතුරු ඔස්සේ ද මෙකී නිවේදනය ශක්තිමත් කර තිබේ. එකී සියුලු දෙනා අන්තර්ගත කිරීම පිළිබඳ ඇගයීම හරහා කොළඹ, යාපනය සහ මඩකලපුව ආදී ප්‍රදේශයන්හි වෙසෙන කාන්තාවන්ට සහ ආන්තික ප්‍රජා කණ්ඩායම් වලට මැතිවරණ ක්‍රියාවලියට සහභාගී වීම සම්බන්ධයෙන් පවතින අවස්ථාවන් සහ බාධාවන් සම්බන්ධයෙන් කරුණු විමසීමේ පර්ශවකාර රැස්වීම් ගණනවාක් සිදු කර තිබේ.

අන්තර්ජාතික ජනරජ ආයතනයෙහි සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි දූත පිරිස අතරට, තානාපති කාල් ඉන්ඩෆර්ත්, එකසත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවෙහි දකුණු ආසියානු කටයුතු පිළිබඳ හිටපු සහකාර රාජ්‍ය ලේකම්ඃ කාරා බියු, දේශපාලන සහ හමුදාමය කටයුතු පිළිබඳ හිටපු නියෝජ්‍ය සහකාර රාජ්‍ය ලේකම්ඃ මාරියා චින් අබ්දුල්ලා, මලයාසියානු පාර්ලිමේන්තු සභිකඃ එස්. වයි. ක්වරයිසි, ඉන්දියානු මැතිවරණ කොමිෂන් සභාවේ හිටපු සභාපතිඃ මන්ප්‍රීට් සිං ආනන්ද්, ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි ආසියානු සහ පැසිපික් කලාපය සඳහා කලාපීය අධ්‍යක්ෂකඃ සහ ස්කොට් මැස්ටික්, අන්තර්ජාතික ජනරජ ආයතනයෙහි වැඩසටහන් පිළිබඳ උප සභාපති යන නියෝජිතයින් ඇතුලත් විය.

වර්ෂ 2019 සැප්තැම්බර් 30 වන දින සිට ඔක්තෝම්බර් 04 වන දින දක්වා කාල පරාසය තුල මෙකී ඒකාබද්ධ දූත පිරිස විසින්ඃ දේශපාලන ක්ෂේත්‍රයෙහි සහිකයින්ඃ මැතිවරණ කොමිෂන් සභාවේනියෝජිතයින්ඃ පාර්ලිමේන්තු සහිකයින්ඃ රජයේ නිළධාරීන්ඃ පුරවැසි මැතිවරණ නිරීක්ෂණ ආයතනයන්හි නියෝජිතයින්ඃ කාන්තා දේශපාලනික ක්‍රියාකාරීන්ඃ මාධ්‍ය හා සම්බන්ධ සංවිධානයන්හි නියෝජිතයින් ද ඇතුළුව සිවිල් සමාජ නියෝජිතයින්ව හමුවන ලදි. අන්තර්ජාතික ජනරජ ආයතනයෙහි සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයෙහි එකාබද්ධ දූත පිරිස විසින් මෙම දූත මෙහෙය සිදුකරන ලද්දේ අන්තර්ජාතික මැතිවරණ නිරීක්ෂණය සඳහා වන මූලධර්ම පිළිබඳ ප්‍රකාශනයට (Declaration of Principles for International Election Observation)[1]අනුකූලව වන අතර, ශ්‍රී ලංකාවේ මැතිවරණයන්හි විශ්වාසනීයත්වය සහ සුජාතභාවය මෙන්ම තමන්ගේ රටෙහි ප්‍රජාතාන්ත්‍රික සංවර්ධනය පිළිබඳ නිශ්චය කිරීම ශ්‍රී ලංකාකික ජනතාව විසින් සිදුකරනු ඇති බව මෙහිලා පිළිගනී. එබැවින් මෙම දූත පිරිස විසින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික ආයතනයන් සහ ක්‍රියාවලින් තවදුරටත් ශක්තිමත් කිරීමේ සහ ඒවාට සහයෝගය ලබාදීමේ අරමුණු පෙරදැරිව මෙම පූර්ව මැතිවරණ ප්‍රකාශය නිකුත් කරනු ලබයි. මෙහිදි, මෙම දූත පිරිස සමඟ හමුවූ සහ ස්වකීය අදහස් නිදහස් ලෙස ප්‍රකාශ කල සෑම දෙනෙකුටම තමන්ගේ කෘතඥතාවය පළකරනු ලැබේ.

වර්ෂ 2015 දී මෙන්ම, මෙ රටේ ප්‍රජාතන්ත්‍රික ආයතනයන්හි ඉදිරි අනාගතය පිළිබඳව තීරණය කරනු ලැබිය හැකි අන්දමේ ඉතා වැදගත් ජාතික මට්ටමේ මැතිවරණයකට ශ්‍රී ලංකාව මුහුණ දී සිටී. බහුවිධතාවය සහ සාමකාමී සහජීවනය වෙනුවෙන් දැක් වූ කැපවීමතවදුරටත් ශක්තිමත් කිරීම සඳහා එතුලින් අවස්ථාවක් ලැබී තිබේ. ශ්‍රී ලංකාව තුල දිගු කාලීන උත්සහයක් දැරූසමගිය බිඳදැමීමට යම් තර්ජනාත්මක තත්වයක් වර්ෂ 2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය මඟින් සිදුවිය. මෙරටේ සාමය සහ ආරක්ෂාව සඳහා මූලික පදනම වන ජන වාර්ගික එකමුතුකම යන්න මැතිවරණ කාල පරාසයන්හිදී යම් අනාරක්ෂිත තත්ත්වයකට පත් වීමේ හැකියාව තිබේ. අවසන් වරට පැවැත්වූ ජනාධිපතිවරණයෙන් පසු සිදු කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සංශෝධනයන් ඔස්සේ ස්වධීන මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද අතර, මෙම දූත පිරිස සමඟ සාකච්ජා කල සෑම සියලු පාර්ශවයක්ම විසින් මැතිවරණ කොමිසම කෙරේ ඇති විශ්වාසය සහ පිළිගැනීම ඉස්මතු කරන ලදි. කෙසේ නමුත් මෙම මැතිවරණයේ දී ශ්‍රී ලංකාව විසින් මුහුණ දෙන සැලැකිය යුතු අභියෝගයන් ප්‍රමාණයක් ද තිබේ.

- ජනාධිපති, අගමැති සහ විපක්ෂ නායක යන මේරටේ පුමුඛ නායකයින් මෙකී මැතිවරණය සඳහා තරඟ නොකරන පසුබිමක ශ්‍රී ලංකාවේ පාර්ශවකරුවන් අපේක්ෂා කරනු ලබන්නේ මෙවර මැතිවරණයඩාත් විවෘත පසුබිමක පැවැත්වෙනු ඇති බවටය. මෙම තත්ත්වය තුලින් උද්ගතවිය හැකි එක් තත්ත්වයක් වන්නේ මුල් වටයේ ඡන්ද ගණන් කිරීමේදී කිසිදු අපේක්ෂකයෙකු ජනාධිපති තනතුර සඳහා පත්වීමටඅවශ්‍ය බහුතර ඡන්ද ප්‍රමාණය ලබා නොගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාවය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ මනාප ඡන්ද ක්‍රමවේදය යටතේ ඡන්ද දායකයින් විසින් දෙවන හා තෙවන මනාපය සලකුණු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සලකා බැලීමට මැතිවරණ කොමිසමට සිදු වේ[2].
- දේශපාලන පක්ෂ වලට පක්ෂග්‍රාහි වන පුද්ගලික මාධ්‍ය මඟින් අනර්ථකාරී මාධ්‍ය පසුබිමක් නිර්මාණය කරමින් තිබේ.
- මැතිවරණය පිළිබඳව තොරතුරු සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන්ප්‍රණාලයක්වශයෙන් ක්‍රියාත්මක විමේ හැකියාව සමාජ මාධ්‍ය ජාලාවන්ට තිබේ. කෙසේ නමුත්, ඒවා අයථා ලෙස භාවිතා

[1]Available at https://www.ndi.org/DoP

[2]ශ්‍රී ලංකාවේ මනාප ඡන්ද ක්‍රමය යටතේ, ඡන්ද පත්‍රිකාවේ සඳහන් අපේක්ෂකයින් අතුරෙන් තිදෙනෙකුට ප්‍රමුඛතාවය අනුව තෝරා ගැනීමේ හැකියාව සෑම සුදුසුකම් ලත් ඡන්ද දායකයෙකුටම ලැබේ. පළමු වටයේ ඡන්ද ගණන් කිරීමේදී, පළමු ප්‍රබතාවය සඳහා ලබා දුන් ඡන්ද පමණක් ගණනය කරනු ලැබේ. පළමු මනාපය ඡන්දය තුලින් කිසිඳු අපේක්ෂකයෙකුට සියයට 50කට වඩා වැඩි ප්‍රතශතයක් ලබා ගත නොහැකි වුවහොත්, පළමු වටයේදී වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා සිටින අපේක්ෂකයින් දෙදෙනා සඳහා සලකුණු කර ඇති දෙවන සහ තෙවන මනාපයන් ගණනය කිරීම මැතිවරණ කොමිසම විසින් කරනු ඇත. එලෙස දෙවන වටයේ ඡන්ද ප්‍රමාණයන් ගණන් කිරීමෙන් පසුව වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා සිටින අපේක්ෂකයා ජයග්‍රහණය කළ ලෙසට ප්‍රකාශ කරනු ලැබේ.

කිරීම ඔස්සේ, මැතිවරණ අපේක්ෂකයින් හෝ සුළු ජන කණ්ඩායම් වලට එරෙහිව අසත්‍ය ප්‍රචාර සහ වෛරී කථනයන් සිදු කිරීමට මග පෑදෙනු ඇත.

- සාමාන්‍යයෙන් ගත් කළ, පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳව පැවැතියේ අඩු මට්ටමක අවධානයකි. කෙසේ නමුත්, අවසන් මැතිවරණ ප්‍රතිඵය නිශ්චිත නොවේ නම්, ආරක්ෂිත තත්ත්වය පිළිබඳ ඇගයීම වෙනස් විය හැකිය.
- මැතිවරණ වියදම් සම්බන්ධයෙන් අදාළ වන නීතින්ගේ හිඟකම නිසාවෙන් සමස්ථ මැතිවරණ ක්‍රියාවලියෙහි විනිවිදභාවය පහළ යෑම මෙන්ම සැකසහිත ගනුදෙනු සහ ගැටුම්කාරී තත්ත්වයන් ඒවා වඩාත් අපැහැදිලි තත්වයකට පත් කරනු ඇත. ඒතුලින් විදේශ මූලාශ මාර්ගයෙන් ලැබෙන මූල්‍ය සම්පත් සහ රාජ්‍ය දෙපල අවභාවිතා කිරීම සම්බන්ධයෙන් වන තත්ත්වයන් ද ඇතුළුව නීති විරෝධී මූල්‍ය කටයුතු සඳහා දොරගුළු විවෘත වීමක් ද වේ.
- මැතිවරණ ව්‍යාපරයන් සඳහා වන ඉහළ වියදම්, දෛනිකව සිදුවන ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම(පුද්ගලිකව සහ අන්තර්ජාලය ඔස්සේ) සහ ඵලදායී නායකත්වයක් ලබා දීම සඳහා ඇති ධාරිතවය වඩා තිබෙන ඒකාකාරී පසුගාමී ආකල්ප ආදීය හේතුවෙන් කාන්තාවන් සහ වෙනත් ආන්තික කණ්ඩායම් වලට දේශපාලනයට සහභාගී වීමේ හැකියාවට බාධා පැවැතීම තවදුරටත් එලෙසම පවතී.
- ශ්‍රී ලංකාවේ ජනතාවගෙන් සැලැකියයුතු ප්‍රමාණයක් ඡන්දය භාවිතා කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව තිබේ. මේ තුළට ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි මිලියන දෙකක පමණ ජන කොටසක් ද ඇතුලත් වේ. මීට අමතරව මැතිවරණ දිනය වන විට වයස අවුරුදු 18 වන මුත් ඡන්දහිමි නාම ලේකනයෙහි ලියාපදිංචි වී නොමැති 180,000 ක පමණ තරුණයින් පිරිසක් ද සිටී.

ඉහත සඳහන් කළ සොයා ගැනීම්ද සහිතව බලන කළ, දූත පිරිස විසින් ජනාධිපතිවරණය සහ ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා ද පහතින් සඳහන් නිර්දේශයන් මැතිවරණ කොමිසමේ, රජයේ දේශපාලන පක්ෂවල සහ වෙනත් මැතිවරණ පාර්ශවකරුවන්ගේ  සලකා බැලීම පිණිස ඉදිරිපත් කරනු ලැබේ. මූලික නිර්දේශයන්ට අමතරවඃ

- **මාධ්‍ය පක්ෂග්‍රාහීත්වයඃ**මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය පවතින කාලය තුළ, මුද්‍රිත, විද්‍යුත් විකාශන සහ සමාජ මාධ්‍ය ජාලා මෙන්ම මැතිවරණ අපේක්ෂකයින් සහ සමාජ මාධ්‍ය ජාලා මෙන්ම මැතිවරණ අපේක්ෂයින් සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් ප්‍රචාරණය සඳහා භාවිතා කරනු ලබන දෑ සම්බන්ධයෙන් වගකීමක් සහ ආචාර ධර්ම වලට අනුකූල මාධ්‍ය හැසිරවීමක් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් කඩිනමින් ඇති කිරීම මැතිවරණ කොමිසම විසින් කළ යුතු වේ. විශේෂයෙන්ම අපක්ෂපාතී සහ සාධාරණ මාධ්‍ය ආවරණයක් සියලුම මැතිවරණ අපේක්ෂකයින්ට ලබා දීම සම්බන්ධයෙන් ගත් කළ, ඉහත කී මාර්ගෝපදේශයන්ට අනුකූලව රාජ්‍ය මෙන්ම පෞද්ගලික මාධ්‍ය ආයතන ද කටයුතු කල යුතු වේ. මෙම ජනාධිපතිවරණයෙන් පසුව, අදහස් ප්‍රකාශ කිරීමේ අයතිවාසිකම් සහ තොරතුරු ලබා ගැනීමේ ප්‍රවේශය තහවුරු කරන අතරටම පුද්ගලික මාධ්‍ය හරහා වෛරී කථනය, සාවද්‍ය තොරතුරු සහ අසත්‍ය ප්‍රචාරයන් ආදිය පාලනය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව සමඟ එක්ව පර්ලිමේන්තුව විසින් අදාළ නෛතික ප්‍රතිපාදන සැකසීම සම්බන්ධයෙන් සලකා බැලිය යුතුය.

  **මැතිවරණ වියදම්ඃ**මැතිවරණ ක්‍රියාවලියෙහි විනිවිදිභාවය ඉහළ නැංවීමටත් වඩාත් දැන් උගත් තෝරාගැනීමක් කිරීම සඳහා පුරවැසියන්ට බලගැන්වීමටත්, මැතිවරණ අපේෂකයින් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන වත්කම් සහ බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධ කළ යුතු වේ. දිගු කාලීන පියවරක් වශයෙන්, මැතිවරණ වියදම් සීමාවන්, වාර්තාකරණය සහ විදේශ දායකත්වයන් ආදිය සම්බන්ධයෙන් ඇති ප්‍රශ්නය පාර්ලිමේන්තුව විසින් විසඳාලීමට අවශ්‍ය කටයුතු කල යුතු වේ.

- **ඡන්ද දායකයින් දැනුවත් කිරීම:** විශේෂයෙන්ම මනාප ඡන්ද ක්‍රමය සහ ඡන්දය ලකුණු කිරීම සම්බන්ධයෙන් ඡන්දදායකයින් සතු දැනුම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් වැඩි වශයෙන් සිදු කිරීමට මැතිවරණ කොමිසම , දේශපාලන පක්ෂ, මාධ්‍ය සහ සිවිල් සමාජය විසින් කටයුතු කල යුතුය. කාන්තාවන්, තරුණ ජන කොටස් සහ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ජනතාව ඉලක්ක කරගනිමින් කෙරෙන ඡන්ද දැයකයින්ගේ දැනුම ඉහළ නැංවීමේ වැඩසටහන්වල වර්ධනයක් විය යුතු අතර සෑම පුරවැසියෙකුගේම ඡන්දයෙහි වටිනාකම, මැතිවරණ ආරවුල් නිරවුල් කිරීමේ යාන්ත්‍රණයන්ට සඳහා ඇති ප්‍රවේශය සහ අනුග්‍රහය ආදී කරුණු කෙරෙහි ඇති වැදගත්කම අවධාරණය කල යුතුය.

- **ආචාරධර්ම පද්ධතිය:**යහපත් භාවතයන්ට අනුරූප වන පරිදි සහ උද්ගතවිය හැකි ප්‍රචණ්ඩත්වයන් මෙන්ම සාවද්‍ය තොරතුරු, අසත්‍ය ප්‍රචාර සහ වෛරී කථනයන් මැඩපැවැත්වීමට උපකාරී වන්නා වූත්, මැතිවරණ කොමිසම මගින් පහසුකම් සලසා බලාත්මක කිරීම සිදු කිරීමට හැකි වන්නාවූත් ස්වේච්ඡා බහු පක්ෂ ආචාර ධර්ම පද්ධතියකට එකඟ වීමට ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ විසින් පියවර ගත යුතුය.

**මැතිවරණ පසුබිම**

ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදී රට වශයෙන්, විශ්වසනීය මැතිවරණ සහ දේශපාලන ක්‍රියාවලීන් ශක්තිමත් ව පවත්වාගෙන යෑමේ සම්ප්‍රදායක් ශ්‍රී ලංකාවට තිබේ. ඉතා ඉහළ මට්ටමේ ගරුත්වයක් පවතින ආයතනයක් වශයෙන් පාර්ශවකරුවන් සලකනු ලබන මැතිවරණ කොමිෂන් සභාවේ ශක්තිය, සුපිළිපන්නභාවය සහ ස්වාධීනත්වය තහවුරු කිරීම වර්ෂ 2015දී සිදු කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයන් තුළින් සිදු විය. මැතිවරණ ආරක්ෂාව සම්බන්ධයෙන් හමුදා අංශ කිසිදු කාර්යය භාරයක් නොකරන අතර මෙකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයන් තුළින් පොලිස් සේවය දේශපාලනික බලපෑම් වලින් ස්වාධීන කර ශක්තිමත් කර තිබේ. මැතිවරණ කාලයන්හිදී ශ්‍රී ලංකා සිවිල් සේවයෙහි සහ පොලිසියෙහි නියෝජිතයින්ට මැතිවරණ කොමිසමෙහි කටයුතු සඳහා අනුයුක්ත කරගන්නා අතර ඒමගින් මැතිවරණයන් නිසි පරිදි ක්‍රියාත්මකවීමක් මැතිවරණ පරිපාලනය ඉතා ගැඹුරින් ආයතනගත වී තිබීමත් එමඟින් තහවුරු කර තිබේ.

දේශපාලන පක්ෂයන්හි ගතිකත්වයන් ඉතා ශීඝ්‍රයෙන් වෙනස් වන අතර, මෙම වසරේ මැතිවරණය මීට ඉහත පැවැති මැතිවරණයන්ට වඩා තරඟකාරීත්වය වැඩි මැතිවරණයක් විය හැකි බවට අපේක්ෂා කරයි. පෙර නොදුටු මෙකී දේශපාලනික පසුබිම තුල, පළමු වටයේ ඡන්ද ගණන් කිරීමෙන් එක් දේශපාලන පක්ෂයකට ස්ථිර වශයෙන්ම බහුතරයක් ඡන්ද ලබා ගෙන මැතිවරණය ජයග්‍රහණය කිරීමට අපහසු බවට දේශපාලනික විශේෂඥයින් පුරෝකථනය කරයි. එබැවින් ජයග්‍රාහී අපේක්ෂයා කවුරුන්දැයි තීරණය කිරීම උදෙසා ශ්‍රී ලංකාවේ මනාප ඡන්ද ක්‍රමය යටතේ ඡන්දදායකයින්ගේ දෙවන සහ තෙවන මනාපයන් ගණන් කිරීමේ ඉඩකඩ උද්ගත විය හැකිය. ජනතාවට ස්වකීය කැමැත්ත මත අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා ඇති ඉඩකඩ විශේෂයෙන් පුද්ගලික මාධ්‍ය ආයතන අතර පවතින ආකාරයට පක්ෂග්‍රාහී මාධ්‍ය පරිසරයක් මගින් අසුරාලිය හැකිය. සමාජ මාධ්‍ය ජාලා වලට පක්ෂග්‍රාහි මාධ්‍ය ද එකතු වූ කළ තනි අපේක්ෂකයෙකුට හෝ අනාරක්ෂිත ජන කණ්ඩායම් වලට එරෙහිව සාවාද්‍ය තොරතුරු බෙදාහැරීම අසත්‍ය ප්‍රචාර සහ වෛරී කථනයන් ආදීය ප්‍රචාරය කිරීමප්‍රබල සාධකයක් විය හැකිය. තවද, රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමේ හැකියාව තුලින් සමහර මැතිවරණ අපේක්ෂකයින්ට අවාසි සහගත තත්වයක් උද්ගත කිරීමේ හැකියාව ඇති සේම මැතිවරණ ක්‍රියාවලියෙහි විශ්වසනීයත්වයද හීන කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අවසන් වී වසර 10කට පසුව වර්ෂ 2019 අපේල් 21 දින සිදු වූ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය තුලින් යලිත් වරක් රටේ සාමයට පහරක් එල්ල වුනි. ජනාධිපතිවරණ කාල පාරාසය තුල දැඩි අනාරක්ෂිත තත්ත්වය තුලින් විශේෂයෙන්ම මුස්ලිම් ප්‍රජාව සහ සුළු ජන කණ්ඩායම් වලට එරෙහිව

මැතිවරණ ප්‍රචාරණ වාග් ප්‍රහාරයක් වීමේ ඉඩකඩක් පවතී. ජාතීන් අතර නොසන්සුන්කාරී තත්වයක් උද්ගත වීම වලක්වාලීම උදෙසා සාම්ප්‍රදායික සහ සමාජජාල මාධ්‍යයන් නිරන්තර සුපරීක්ෂණයකට පාත්‍ර වේ. ඡන්ද දායකයින් සමග කටයුතු කිරීමේදී දේශපාලන පක්ෂ සහ මැතිවරණ අපේක්ෂකයින් හරහා හිතකර හෝ කඩාකප්පල්කාරී තොරතුරුද සන්නිවේදනය විය හැකිය. තවද පුරවැසි මැතිවරණ නිරීක්ෂකයින් සහ මැතිවරණ නිලධාරීන් ස්වකීය නිරීක්ෂණ කටයුතු සහ මැතිවරණ කටයුතු මෙහෙය වීමේදී දැඩි අපක්ෂපාතීත්වයකින් ක්‍රියා කිරීම අවශ්‍ය වේ.

**ප්‍රධාන නිරීක්ෂණයන්**

**මැතිවරණ පරිපාලනය**

වඩාත් පුළුල් ප්‍රතිසංස්කරණයන්ගේ එක් අංගයක් වශයෙන් වර්ෂ 2015 මැතිවරණයෙන් පසුව බලාත්මක කරන ලද ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය මගින් ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි. සමස්ථයක් ලෙස ගත් කල, දූත පිරිස හමු වූ දේශීය පාර්ශවකරුවන්ගේ මතය වූයේ විශ්වසනීය මැතිවරණයන් පැවැත්වීමට ඇති හැකියාව මැතිවරණ කොමිසමට ඇති සේම එය අපක්ෂපාතී ආයතනයක් බවයි. ඡන්ද හිමි නාම ලේකනය සම්බන්ධයෙන්ද ඉහළ මට්ටමේ විශ්වාසනීයත්වයක් තිබේ. පොදුවේ ගත් කළ වාර්ෂිකව ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ඵලදායි මට්ටමක පවතින බවට සලකන නමුදු, ආබාධ සහිත පුද්ගලයින්ට සංක්‍රාන්තික ලිංගික තැනැත්තන් සහ කාන්තාවන්ට අති ප්‍රවේශයන් සම්බන්ධයෙන් තවදුරටත් අභියෝගයන් පවතී. මේ අතර, මැතිවරණ දිනය වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ වන තරුණයින් 180,000 ක් පමණ සිටින මුත් ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම අවසන් කළ වර්ෂ 2018 මැයි 31 වන දිනට පසුව ඔවුන් නිසි වයස සීමාවට ලඟා වීම හේතුවෙන් ඔවුන්ට ඡන්ද ලබා දීමේ හැකියාව නොමැත.

වර්ෂ 1978 දී විධායක ජනාධිපති ධුරයේ හඳුන්වා දීමෙන් පසුව පළමු වතාවට ඡන්දදායකයින්ගේ දෙවන සහ තෙවන මනාපය මැතිවරණයෙහි අවසන් ප්‍රතිඵලය සඳහා බලපානු ඇති බවට අදහසක් සමහර පිරිස් සතුව තිබේ. කෙසේ නමුත්, දූත පිරිස විසින් නිරීක්ෂණය කල පරිදි, විශේෂයෙන්ම දෙවන සහ තෙවන මනාපයන් ගණනය කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳව අඩු මට්ටමක අවබෝධයක් පවතී. මෙම තත්ත්වය වූ කලී, ඡන්ද දායකයින් දැනුවත් කිරීමේ කාර්යභාරයෙහි පැහැදිලි හිඩැසක් බවත් එතුලින් ප්‍රතික්ෂේපිත ඡන්ද ප්‍රමාණයන් ඉහළ යෑමේ තත්වයක් උද්ගත විය හැකි බවත් පෙන්නුම් කෙරෙන පසුබිමක් වන්නා සේම ජයග්‍රාහී අපේක්ෂකයා තීරණය කරනු ලැබීම සඳහා මනාප ඡන්දය භාවිතා කරන ආකාරය පිළිබඳව ඡන්ද දායකයින් නිසි පරිදි දැනුවත් නොකරයි නම් මැතිවරණයෙන් පසුව නොසන්සුන්කාරී තත්ත්වයක්ද ඇති කරනු ලැබිය හැකිය.

රජයේ නිලධාරීන් සහ රජයේ ආයතනයන්හි කාර්යයන් මෙහෙය වීමේ අධිකාරීත්වය පවතින මැතිවරණ ව්‍යුහය තුලින් මැතිවරණ කොමිසමට බලය ලැබේ. එකී බලය භාවිතා කිරීමේදී, දේශපාලන වාසි ලබා ගැනීම උදෙසා රජයේ දේපල අවභාවිතා කිරීම් වලක්වාලීම උදෙසා මාධ්‍ය සඳහා මාර්ගෝපදේශයන් මෙන්ම රාජ්‍ය නිලධාරීන් සඳහා විධානයන් ද මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබේ. මීට පෙර මැතිවරණයන්හිදී මෙන්ම, ඡන්දය පැවැත්වීමට පැය 48කට පෙරමැතිවරණ ප්‍රචාරණය සහ අනෙකුත් මැතිවරණ අධිකාරීන් මත නිශ්ෂබද කාල පාරාසයක් බල පැවැත්වීමට මැතිවරණ කොමිසම විසින් කටයුතු කරනු ලබයි. තැපැල් ඡන්දය භාවිතා කිරීම පොලිසිය, ආරක්ෂක හමුදාව සහ සිවිල් සේවයේ නියුතු වුවන් ආදී රජයේ නිලධාරීන් සඳහා පමණක් සීමා වේ. . රටින් බැහැරව සිටින පුද්ගලයින්ට නියෝජිතයෙකු මගින් ඡන්දය ලබා දීම සඳහා ඉඩප්‍රස්ථාවක් ලබා නොදෙන අතර එතුලින් දැනට විදෙස්ගතව ජීවත් වන මිලියන දෙකකට පමණ ආසන්න සංක්‍රමණික සේවා නියුක්තිකයන්ගේ ඡන්දය දැමීමේ අවස්ථාව අහිමි වේ. විදේස්ගතව වෙසෙන ශ්‍රී ලාංකික පුරවැසියන්ට ස්වකීය ඡන්දය ලබාදීමට අවශ්‍ය නම්, ඡන්ද නාම ලේකනයෙහි ලියාපදිංචි වීමේ අවශ්‍යතාවන් සපුරාලිය යුතු වන්නා සේම මැතිවරණ පැවැත්වෙන දිනය තුල රට තුල සිටිය යුතු වේ.

**මාධ්‍ය සහ තොරතුරු පිළිබඳව වාතාවරණය**

දූත පිරිසට දැන ගැනීමට ලැබුන පරිදි සාමාන්‍යයෙන් ප්‍රධාන ධාරාවේ මාධ්‍යන් ද ඇතුළුව පුද්ගලික මාධ්‍ය ආයතනයන් දැඩි ලෙස පක්ෂග්‍රාහි වුත් දේශපාලනික ක්‍රියා කාරීන්ගේ නියෝජිතයින් වශයෙනුත් ක්‍රියා කරන්නා සේම සමහර අවස්ථාවන් හිදී සාවද්‍ය තොරතුරු සහ අසත්‍ය ප්‍රචාර ලබාදීමේ මූලාශ්‍ර වශයෙන්ද ක්‍රියාත්මක වේ. ස්වකීය කැමැත්ත අනුව වඩාත් දැන උගත් ඇසුරකින් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා පුරවැසියන්ට ඇති අවස්ථාව ඉහත කී තත්ත්වය මත හීන වීම සිදු වේ.

දේශපාලන ප්‍රභූන් සමඟ සැබැඳියාවක් පවත්වන තැනැත්තන් සතු පුද්ගලික මාධ්‍ය හිමිකාරකත්වය මගින් මාධ්‍ය වාර්ථාකරණය දැඩි ලෙස විභේදනය වී තිබේ.

පුද්ගලික මාධ්‍ය සම්බන්ධයෙන් කිසිදු අධිකාරී බලය මැතිවරණ කොමිසමට නොමැතිය ද, මැතිවරණ කාල පරිච්ඡේදය තුල රාජ්‍ය මාධ්‍ය සම්බන්ධයෙන් පූර්ණ පාලන බලයක් ඊට තිබේ. මේ තුළින් රජයේ මාධ්‍ය ඔස්සේ අපක්ෂපාතී සහ සාධාරණ මාධ්‍ය ආවරණයක් ලබාදීම තහවුරු කිරීමට හැකියාවක් ඇතැයි සමහර පාර්ශවකරුවන් විසින් පෙන්වා දේ. අනෙකුත් පාර්ශවකරාවන් පෙන්වා දෙන ලද්දේ වෛරී කථනය හෝ අසත්‍ය තොරතුරු සහ මාධ්‍ය ප්‍රචාර රාජ්‍ය මාධ්‍ය තුලින් සිදුවීම වැලක්වීම සඳහා සිය බලය භාවිතා කිරීමට මැතිවරණ කොමිසම කටයුතු කළයුතු බවයි.

ජනාධිපතිවරණය පැවැත්වීමට තිබෙන පසුබිමක, ශ්‍රී ලංකාවේ ජාතික රූපවාහිනි ජාලය, එනම් ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව ජනමාධ්‍ය අමාත්‍යංශයෙන් ඉවත් කර ආරක්ෂක අමාත්‍යංශය වෙත පවරා ගැනීම සම්බන්ධයෙන් ස්වකීය කනසල්ල ජනමාධ්‍ය කණ්ඩායම් ඇතුළුව සිවිල් සමාජ සංවිධාන ගණනාවක් පෙන්වා දුනි. දේශපාලනික සංවාදයන් සහ ඓතිහාසික කථා වස්තූන් පිළිබඳව මතවාද ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණයන් වශයෙන් අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය ජාලා පැවැතියද, පොදු මහජනතාවට සන්නිවේදන කටයුතු සිදු කිරීමේ වඩාත් වැදගත් මාධ්‍ය වශයෙන් අදටත් පවතින්නේ සාම්ප්‍රදායික මාධ්‍ය තුලින් විකාශනය කෙරෙන රූපවාහිනී විකාශනයන්ය. එවැනි පසුබිමක හිඳ බලන කළ, ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව ආරක්ෂක අමාත්‍යංශය යටතට පවරා ගැනීම තුලින් සියලු දේශපාලනික කණ්ඩායම් සඳහා සමබර විකාශනයන් මෙන්ම සමාන ප්‍රවේශයක් ලබාදීම සම්බන්ධයෙන් එතරම් සුදුසු නොවන තත්ත්වයක් උද්ගත කර ඇති බව ඇතැම් පාර්ශව කරුවන්ට හැඟී තිබේ.

මුස්ලිම් ප්‍රජාවට එරෙහිව ප්‍රචණ්ඩත්වය ඇති කිරීම සඳහා මුහුණු පොත භාවිත කිරීම සම්බන්ධයෙන් මෑතකදී ඉස්මතු වූ චෝදනාවන් සලකා බලන කළ ජනවාර්ගික කණ්ඩායම් අතර නොසන්සුන්තාවයන් ඇති වීම වලක්වාලීමේ අරමුණු ඇතිව සාම්ප්‍රදායික මාධ්‍ය සහ සමාජ මාධ්‍ය වැඩි වශයෙන් නිරීක්ෂණයට භාජනය කරනු ලැබිය හැක. කෙසේ නමුත් මෑත කාලයන්හිදි අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය අක්‍රිය කර තිබීමේ තත්තවයන් මගින් එකී මාධ්‍යන්හි නිරත වන්නන්ගේ ක්‍රියාකාරකම් සහ සන්නිවේදන කටයුතු කිරීමේ හැකියාව දුර්වල කර තිබෙන බවද සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් පෙන්වා දෙන ලදි.

පළමු වටයේ මනාප ඡන්ද ගණන් කිරීම තුලින් කිසිදු අපේක්ෂකයෙකු බහුතර ඡන්ද ප්‍රමාණයක් නොගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව මත විශේෂයෙන්ම මනාප ඡන්දය ඡන්ද පත්‍රිකාවක් සලකුණු කරන ආකාරය පිළිබඳව අපක්ෂපාතී ලෙස ඡන්දදායකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් රජයේ මාධ්‍ය මඟින් විකාශය කිරීමට අවශ්‍ය වැඩකටයුතු මැතිවරණ කොමිසම විසින් කළ යුතු බවට සමහර පාර්ශවකරුවන් විසින් පෙන්වා දෙන ලදී.

**ආරක්ෂාව සහ මැතිවරණ ප්‍රචණ්ඩත්වය**

රටේ මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් හා ආරක්ෂාව දේශපාලනික බලපෑම් වලින් තොරව පොලීසිය කටයුතු කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ඔස්සේ තහවුරු කර ඇති බවත් පොදුවේ ගත් කළ ජාතික මට්ටමේදී පොලීසිය ස්වාධීනව සහ අපක්ෂපාතීව කටයුතු කරන බවටත් පාර්ශවකරුවන් විසින්

පෙන්වා දෙන ලදි. කෙසේ නමුත් මැතිවරණය පිළිබඳ ආරක්ෂක කටයුතු ක්‍රියාත්මක කිරීම සහ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා සඳහා ප්‍රතිචාර දැකවීමේදි ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ කාර්යභාරය සම්බන්ධයෙන් යම් යම් ගැටළුකාරී තත්ත්වයන් පැවැතිය හැකි බව පෙන්වා දෙන ලදී.

පූර්ව මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා සම්බන්ධයෙන් වැඩි සැලැකිල්ලක් නොදැක්වුවද, ආන්තික ජන කොටස් වල ඡන්දය දැමීමේ ප්‍රමාණය දුර්වල කිරීමට බියවැද්දීම සිදු විය හැකි බවට සමහර පාර්ශවකරුවන් පෙන්වා දෙන ලදි. මැතිවරණය පත්වනු ලබන ස්වභාවය සහ පාරාජයට පත්විය හැකි අපේක්ෂකයා සහ එම පාර්ශවයෙහි ක්‍රියාකාරීන් හැසිරීමේ ස්වභාවය අනුව පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩත්ව තත්ත්වයන් ඇති වීමේ හැකියාව පිළිඉඳව දැඩි කනස්සල්ලක් තිබෙන බවපෙන්නුම් කෙරුනි. මනාප ඡන්ද භාවිතා කිරීම සම්බන්ධයෙන් ජනතාව අතර පවතින අඩු දැනුවත් භාවය හේතුවෙන් මැතිවරණ ප්‍රචණ්ඩත්වය උද්ගතවීමේ ඉඩකඩක් ඇති වීමට හේතු පාදක විය හැකිය.

**මැතිවරණ වියදම්**

ශ්‍රී ලංකාවේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා කෙරෙන වියදම් නිරීක්ෂණය කිරීම සඳහා නීතීන් හෝ රාජ්‍ය යාන්ත්‍රනයන් නොමැත. විශේෂයෙන්ම මැතිවරණ අපේක්ෂකයන්ට ස්වකීය මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා ලැබෙන දායකත්වයන් හෝ කරනු ලබන වියදම් පිළිබඳව වාර්තා කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන නීතියක් නොමැත. මේ තුළින් මැතිවරණ ක්‍රියාවලියෙහි සමස්ථ විනිවිදභාවය හීන කරන්නා සේම ප්‍රශ්නකාරී ගනුදෙනු සහ ලැදියාවන්ගේ පිළිගැටුම්කාරී තත්ත්වයන් ප්‍රශ්න කිරීමේ හැකියාවද හීන කරයි. තවද, මැතිවරණ අපේක්ෂකයන් විසින් ස්වකීය මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයන් සඳහා මූල්‍ය සම්පත් ලබා ගැනීමට ඔවුන්ගේ පුද්ගලික මුදල් හා වෘතීය ජාලයන් භාවිතා කිරීම සඳහා ඇති සීමිත ප්‍රවේශය හේතුවෙන් කාන්තාවන්, තරුණයින් සහ ආන්තික ජන කණ්ඩායම්වලට සහභාගීවීම සඳහා ඇති හැකියාවට සැලකිය යුතු බාධාවක් මෙතුළින් උද්ගත වේ. එම තත්ත්වය හරහා විදේශ මූලාශයන්ද ඇතුළුව නීති විරෝධී මූල්‍ය තත්ත්වයන් ඇති කිරීමට මෙන්ම රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමටද දොරගුළු විවෘත කෙරේ. මැතිවරණ කොමිසම විසින් මැතිවරණ අපේක්ෂකයින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම මේ වන විට සිදු වේ. මෑතකදී තොරතුරු අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව විසින් ලබා දුන් තීන්දුවකට අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශයන් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ ප්‍රතිපාදන යටතට ගැනෙන බවත් එම නිසා පුරවැසියන් ඉල්ලා සිටින ලදහොත් ඔවුන්ට එකී ලේඛන ලබාදිය යුතු වේ. විනිවිදභාවය උදේසා වත්කම් සහ බැරකම් ප්‍රකාශයන් මහජනතාවට ලබාගැනීමට ඉඩකඩ සැලැසිය යුතුයි යන යෝජනාවන් දූත පිරිසට දැන ගැනිමට ලැබුණි. කෙසේ නමුත් එකී තෝරතුරු ප්‍රසිද්ධ කිරීම සඳහා කිසිදු ආකාරයක බාධාවක් අපේක්ෂකයින්ට නොමැත.

**දේශපාලන පක්ෂ සහ මැතිවරණ අපේක්ෂකයින්**

වර්ෂ 1978 දී විධායක ජනාධිපති ක්‍රමය ස්ථාපිත කිරීමෙන් පසුව, ප්‍රථම වරට ජනාධිපතිවරණයක් සඳහා මෙරටේ ජනාධිපති අගමැති හෝ විපක්ෂ නායක ආදී වශයෙන් වූ ප්‍රධාන පෙළේ නායකයින් කිසිවෙකුත් ජනාධිපතිවරණය සඳහා යොජනා නොවූ මැතිවරණය මෙය වේ. ප්‍රධාන පෙළේ අපේක්ෂකයින් දෙදෙනෙකු ඉදිරිපත් වී පළමු වටයේ පනාප ඡන්ද ගණන් කිරීමේදී එක් අපේක්ෂකයෙකු නියත බහුතර ඡන්ද ප්‍රමාණයක් ලබාගෙන ජයග්‍රහනය කළ අන්දමට මීට පෙර පැවැති ජනාධිපතිවරණ මෙන්ම නොව , මෙම මැතිවරණයේ දී අපේක්ෂකයින්ගේ සංයුතිය බලන කළ බෝහෝ පාර්ශවකරුවන් අපේක්ෂා කරනු ලබන්නේ කිසිදු අපේක්ෂකයකු සියයට 50කට වැඩි ඡන්ද ප්‍රතිශතයක් ගත හැකි මට්ටමක නොමැති බවත් එබැවින් දෙවන සහ තෙවන මනාපයන් ගණන් කිරීමේ තත්ත්වයක් උදා වන බවත්ය.

විශේෂයෙන්ම මැතිවරණ නොසන්සුන්තාවයන් හෝ ප්‍රචණ්ඩත්වයන් ඇති වීමේ තත්ත්වයක් ඇති අවස්ථාවන්ද ඇතුළුව ලෝකයේ රටවල් ගණනාවක දී ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය හා අන්තර්ජාතික ජනරජ ආයතනය දේශීය ආයතනයන් සමඟ ඒකාබද්ධව, ගෞරවාන්විත සහ ප්‍රතිපත්ති මත පදනම් වන මැතිවරණය ව්‍යාපාරයන් පැවැත්වීමට සහ සාවද්‍ය තොරතුරු අසත්‍ය ප්‍රචාර සහ වෛරී කථනයන්

වැලැක්වීම උදෙසා දේශපාලන පක්ෂවලට ආචාර ධර්ම පද්ධතියකට අනුව ක්‍රියාකිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කර තිබේ. ශ්‍රී ලංකාව ගත් කළ ඒ ඒ දේශපාලන පක්ෂ විසින් තනි තනි වශයෙන් ආචාරධර්ම පද්ධතීන් අනුගමනය කරන මුත් ඒවා බලාත්මක කිරීම දුෂ්කර වන අතර මෙම මැතිවරණය සඳහා සියලු පක්ෂ වල එකගත්වය මත ඇති කරගත් ආචාර ධර්ම පද්ධතියක් නොමැත.

සමහර පාර්ශවකරුවන් විසින් පෙන්වා දෙන ලද්දේ පූර්ව මැතිවරණ කාල පරාසය තුළ ජනාධිපතිවරණ අපේක්ෂකයින් සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් රාජ්‍ය දේපල අවභාවිතා කිරීමේ වැඩි ඉඩ ප්‍රස්ථාවක් තිබෙන බවට පෙන්වා දුනි. ප්‍රවාහනය ද්‍රව්‍ය සහ වෙනත් භාණ්ඩමය ආධාර සඳහා රජය විසින් සහනාධාර ලබාදීම ද ඇතුලත්ව එකී රාජ්‍ය දේපල අවභාවිතා වීම විවිධාකර ස්වභාවයන්ගෙන් විය හැකිය.

**කාන්තාවන් අන්තර්ගත කිරීම**

ලෝකයේ ප්‍රථම රාජ්‍ය නායිකාව[3]තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට සත්‍ය වශයෙන්ම ආඩම්බර විය හැකිය. කෙසේ නමුත් පාර්ලිමේන්තුවේ සිටින කාන්තා නියෝජිතවරියන් සංඛ්‍යාව සියයට 5.7 ක් තරම් වූ ඉතා පහළ මට්ටමක (පාර්ලිමේන්තු සභිකයින් 225 දෙනෙකුගෙන් 13න් දෙනෙකු)පවතින අතර කැබිනට් මණ්ඩලයෙහි සහ වෙනත් දේශපාල නායකත්ව තනතුරු සඳහා පත් කරන ලද කාන්තාවන්ගේ ප්‍රමාණය ද ඉතා පහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සඳහා සියයට 25ක් කාන්තා කෝටා ක්‍රමයක් හඳුන්වා දුන්නද එවැනි කෝටා ක්‍රමයක් පළාත් හෝ ජාතික මට්ටම් සඳහා මේ වන තෙක් හඳුන්වා දී නොමැත.

දිගු කාලීන දේශපාලන ස්ථාවරත්වයක් සහිත පවුල් වලට සම්බන්ධතාවයක් නොමැති කාන්තාවන් මැතිවරණයන් සඳහා තරග කිරීමේදී. මැතිවරණයන් සඳහා දැරීමට සිදුවන අධික වියදම්, පුද්ගලිකව සහ අන්තර්ජාලය හරහා සිදුවන ප්‍රචණ්ඩත්වය සහ දේශපාලන නායකත්වය දීම සම්බන්ධයෙන් තමන්ට ඇති හැකියාව පිළිබඳව සමාජයේ දිගු කාලයක් එල්බගත් මති මතාන්තර සහ සාම්ප්‍රදායික ආකල්ප ආදිය ද ඇතුළුව විවිධාකාර බාධකයන්ට මුහුණ දීමට සිදුව තිබේ. දේශපාලනයේදී කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය සිදු කරනු ලබන්නන් අතරට පවුලේ සාමාජිකයින්, පක්ෂ සාමාජිකයින්

විරුද්ධ පාකක්ෂකයින්, පක්ෂ මහජනතාව ආදී කොටස් ඇතුලත් වේ. මැතිවරණයන්හිදී කාන්තාවන්ට සිදුවන ප්‍රචණ්ඩත්වයට එරෙහිව දඬුවම් පැමිණවීමට හෝ එවැනි ක්‍රියා වලින් කාන්තාවන්ව ආරක්ෂා කිරීම සඳහා ගැලපෙන නීතින් ද වර්තමානයෙහි දක්නට නොලැබේ. නීතිය තුලින් ලබා දී ඇති දඬුවම් ක්‍රියාත්මක කිරීමද නිසි අයුරින් ඉටු නොවේ. විශේෂයෙන්ම තරුණ කාන්තාවන් තමන්ගේ ස්ත්‍රී ආරක්ෂාභාවය සහ වයස යන කරුණ මත විවිධ අභියෝගයන්ට මුහුණ දේ. ඒ අතරම දේශපාලනයෙහි ව්‍යාපාරයන්හි, සහ සිවිල් සමාජ කටයුතු වල යෙදී සිටින මුස්ලිම් කාන්තාවන්, මෙන්ම මුස්ලිම් පිරිමින්ද මුස්ලිම් කාන්තාවන් දේශපාලනයට සහභාගී විමේ සහ නායකත්වය දැරීමේ තත්ත්වය දියුණු කිරීම සඳහා ක්‍රියාකාරී ලෙස කටයුතු කරමින් සිටී.

**ආන්තික ජන කණ්ඩායම් අන්තර්ගත කිරීම**

මැතිවරණයන් යනු බල පුලුවන්කාර කොටස් වල තවදුරටත් ශක්තිමත් කරනු ලබන්නා වූ යාන්ත්‍රණයක් බවට හැගිමක් දුත පිරිස සහ සියලු දෙනා අන්තර්ගත වීම පිළිබඳ ඇගයීමේ කණ්ඩායම හමු වූ ආන්තික ජන කණ්ඩායම් අතර පවතින බව පෙන්නුම් කෙරුනි. මෙතුලින් මැතිවරණ සහ දේශපාලනික

[3]වර්ෂ 1960 දී සිරිමාවෝ බණ්ඩාරනායක ශ්‍රී ලංකාවේ අගමැති වශයෙන් තෝරාගන්නා විට ඇය ලෝකයේ ප්‍රථම රජය නායිකාව විය.

ක්‍රියාවලියට ආන්තික ජන කොටස්වලට සහභාගී වීමට ඇති ඉඩ ප්‍රස්ථාව සඳහා තවදුරටත් බාධා පමුණුවන තත්ත්වයක් උද්ගත කරයි. මැතිවරණ සඳහා වියදම් කිරීමේ සීමාවන් නොමැති කමද මැතිවරණ වියදම් පිළිබඳව රෙගුලාසි නොමැතිකමින් ප්‍රභූ ජන කොටස්වලට අයත් නොවන පක්ෂ ව්‍යුහයන්ට අයත් නොවන කාන්තාවන්, සුළු ජන කොටස් සහ තරුණ පිරිස් මැතිවරණ අපේක්ෂකයන් සඳහා ඉතා ඉහළ මට්ටමේ මූල්‍ය බාධාවක් ඇති කරයි.

*ජනවාර්ගික සහ ආගමික සුළුතරයන්*

මීට පෙර පැවැති මැතිවරණයන්ට සාපේක්ෂව ගත් කළ එක් දේශපාලන පක්ෂයකට ස්වකීය ඡන්ද පදනම මත පිහිටා එක හෙලාම මෙම මැතිවරණය ජයග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය බහුතර ඡන්ද ප්‍රමාණය ලබා ගැනීම දුෂ්කර විය හැක. එසේ හෙයින් සුළු ජන කොටස්වල ඡන්ද දායකයින් ආකර්ෂනය කර ගැනීම සඳහා ප්‍රබල දේශපාලනික පෙළඹවීම් තිබෙනු දැකිය හැක. කෙසේ නමුත්, සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු සත්‍ය වෙනසක් සහ ප්‍රතිසංස්කරණ පිළිබඳ අපේක්ෂාවන් සුන්වීම තුළින් උද්ගත වූ දැඩි කලකිරීම සහ අපේක්ෂා භංගත්වය සුළු ජන කණ්ඩායම් තුළින් ඉස්මතු විය. මෙම තත්ත්වය විශේෂයෙන්ම දැඩි ලෙස දෙමළ ප්‍රජාව අතර පවතින්නා සේම මැතිවරණය සඳහා ඔවන්ගේ සහභාගීත්වයට එය බලපෑ හැක.

ඡන්දය දීම සඳහා අවශ්‍ය සුදුසු ලේඛන සඳහා මෙන්ම ඡන්දය භාවිතා කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථාන පිහිටා ඇති ස්ථානවලට ප්‍රවේශ වීමේ හැකියාවද පොදුවේ ගත් කළ සුළු ජන කොටස්වලට තිබේ. කෙසේ නමුත්, සමහර පාර්ශවකරුවන් විසින් පෙන්වා දෙන ලද්දේ, විශේෂයෙන්ම සිංහල බහුතරයක් වෙසෙන ප්‍රදේශයන්හි පිහිටා ඇති මුස්ලිම් ගම්මාන සහ නැගෙනහිර ප්‍රදේශයේ දෙමළ සහ මුස්ලිම් ඡන්ද යටපත් කිරීම සඳහා බිය වැද්දීම්, ප්‍රචණ්ඩත්වය, සහ රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම සඳහා විවිධ උත්සාහයන් පැවතිය හැකි බවය. මුස්ලිම් ඡන්ද යටපත් කිරීම සඳහා ආගම පදනම් කරගත් ජාතිවාදී කණ්ඩායම් විසින් මුස්ලිම් ප්‍රජාව ඉලනක්ක කරගත් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්හි නිරත වීමට ඇති ඉඩ ප්‍රස්ථාව සම්බන්ධයෙන් බියක් ඇති බව පෙනේ.

*තරුණයින්*

වර්ෂ 2015 ජනාධිපතිවරණය පැවැත්වුණු අවස්ථාව වන විට ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසුකම් නොලත් බොහෝ ශ්‍රී ලංකික තරුණයින් මෙම වසරේ නොවැම්බර් 16 වන දින වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ඇත. වර්ෂ 2018 සඳහා වූ ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේ අවසන් දිනයෙන් පසු වසස් පූර්ණත්වයට පත් 180,000 පමණ ප්‍රමාණයක් මෙම වසරේ මැතිවරණ ක්‍රියාවලිය සඳහා භාවිතා කරනු ලැබේ. මෙම ජනධිපතිවරණය සම්බන්ධයෙන් එතරම් උනන්දුවක් තරුණ කණ්ඩායම් අතර නොමැති බවට හැඟීමක් ද සමහරුන් අතර පවතී. දේශපාලන පක්ෂ විසින් මෙන්ම නොසලකා හැර ඇති බවට හෝ කිසියම් ප්‍රදේශයක හෝ විශේෂයෙන්ම සුළු ජන කණ්ඩායමක් තුළ ස්වකීය ශක්තිමත්භාවය තහවුරු කර ගැනීම සඳහා දේශපාලන පක්ෂ විසින් තරුණයින්ව යොදා ගෙන ඇති බවට හැඟීම්ක් තරුණ ජන කොටස් අතර ඇති අතර එතුළින් තරුණයින්ව මන්දෝත්සාහි කිරීමට මෙන්ම ඔවුන්ගේ ඡන්ද අඩු වශයෙන් භාවිතා වීමටද හේතු වේ. ශ්‍රී ලංකාවේ තරුණයින්ට දේශපාලනික වශයෙන් සාමුහිකව සංවිධානගත වීම සඳහා අවස්ථාවන් කීපයක් පවතී. තරුණයින් සතු අත්දැකීම් අඩු බවට ඇති හැඟීම, දේශපාලන පක්ෂවලින් ඇති අඩු සහයෝගය දේශපාලනයට ප්‍රවේශ වීම සහ මැතිවරණ ව්‍යාපාරයන් සඳහා යන අධික පිරිවැය ආදී හේතු පදනම් කොටගෙන දේශපාලන පක්ෂ සහ ජනතා ව්‍යාපරයන් තුළ නායකත්ව තනතුරු සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව සම්බන්ධයෙන් දුෂ්කරතාවයන් බොහෝමයකට තරුණයින් මුහුණ දේ.

*ආබාධ සහිත පුද්ගලයින්*

ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැති ඡන්ද දායකයින් දැනුවත් කිරීම සහ දේශපාලනික වේදිකාවන් පිළිබඳ තොරතුරු, ඡන්ද මධ්‍යස්ථානයන් වෙත භෞතික වශයෙන් ප්‍රවේශ වීමට ඇති ප්‍රමාණවත් නොවන ඉඩ ප්‍රස්තාව, සහ ස්වාධීනව මෙන්ම රහස්‍ය භාවයකින් යුක්තව ඡන්දය භාවිතා කිරීමට තරම් ප්‍රමාණවත් පහසුකම් නොමැති වීමද ආදී කරුණු ද ඇතුළත්ව ස්වකීය ඡන්දය භාවිතා කිරීමේදි මුහුණ දීමට සිදුවන බාධාවන් ගණනනාවක් ආබාධ සහිත පුද්ගලයන් ඉදිරියෙහි ඇත. ජනාධිපතිවරණ මැතිවරණ පනත යටතේ දෙයාකාරයකින් අනුග්‍රහය දැක්වීමේ ඉඩකඩ පවතී. ආබාධ සහිත පුද්ගලයකුට ඡන්දය දැමීම සඳහා උපකාර කිරීම හා ප්‍රවාහනය ලබා දීම. වර්තමානයේ නිර්මාණය කර ඇති ඡන්ද දායකයින්ගේ නම් ඇතුළත් කිරීමේ ලයිස්තුවට ඡන්ද දායකයින්ට අවශ්‍ය සුවිශේෂ සහයෝගයන් හෝ අනුග්‍රහයන් පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීමේ හැකියාව පවතින මුත් ඒවා සඳහා අනුමැති ලබා ගැනීමේ ක්‍රියාවලිය අපහසුතත්වයක් පවතින බව පෙනේ.

සමීක්ෂණයක් ඇසුරෙන් ඡන්දදායකයින්ට අවශ්‍ය කරන්නා වූ අනුග්‍රහයන් පිළිබඳව ඇගයීම සඳහා යම් උත්සාහයන් මැතිවරණ කොමිෂන් සභාව විසින් දරා සිටින අතර එකී සමීක්ෂණයෙන් ඉස්මතු වූ තොරතුරු මෙම ජනාධිපතිවරණය සඳහා භාවිතා කිරීමට හැකි නොවනු ඇත.

*සමලිංගික කාන්තා, සමලිංගික පුරුෂ, ද්වි ලිංගික, සන්ක්‍රාන්ති ලිංගික හා අන්තර් ලිංගික ඡන්ද දායකයින් (LGBTI ප්‍රජාව)*

ඡන්ද දායකයින් පක්ෂ ක්‍රියාකාරීන් සහ මැතිවරණ අපේක්ෂකයන් වශයෙන් සහභාගී වීම සඳහා LGBTI ප්‍රජාවේ සාමාජිකයන්ට ඇති, හැකියාව සම්බන්ධයෙන් බලපාන ආකාරයෙහි පුළුල් සාමාජීය වෙනස් කොට සැලැකීමකට මුහුණ දීමට එකී ප්‍රජාවට සිදු වී තිබේ. සමහර දේශපාලඥයන් විසින් තම දේශපාලනික ප්‍රතිවාදීන්ට පහර දීම සඳහා LGBTI ප්‍රජාව හඳුන්වන නාමය පරිනාමත්මක ස්වරූපයකින් භාවිතා කරයි. සංක්‍රාන්තික ලිංගික ප්‍රජාව ඉහත කී තත්ත්වයට අමතරව අභියෝගයන්ට මුහුණ දීමට සිදු වන්නේ, ස්වකීය හැඳුනුම්පතෙහි සිත්‍රී පුරුෂ භාවය වෙනස් කිරීමට යැමේදී වන අතර එහිදි සංක්‍රාන්තික ලිංගිකත්වය පූර්ණ වූ ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට ඡන්ද හිමි නාමලේඛනයෙහි ලියාපදිංචි වීමේදී එම ත්ත්වයට උත්ගත වේ. මෙම තත්ත්වය හේතුවෙන්, තමන්ගේ භෞතික ශාරීරික පෙනුමට සමාන නොවන අන්දමේ ස්ත්‍රී පුරුෂ භාවයක් අදාල ලේඛනයන්හි සටහන්ව ඇති අවස්ථාවක ඡන්දය දැමීමට යැමේදී මෙම සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවේ සාමාජිකයන් වංචනික ලෙස ඡන්දය දැමීමේ චෝදනාවට ලක් වීමේ අවධානමකට මුහුණ දේ. මෙකී බාධාව හේතුවෙන් එවන් බොහෝ දෙනෙකු කිසි සේත් ඡන්දය භාවිතා නොකර සිටීමේ තත්ත්වයකට යොමු කරයි.

**පුරවැසි මැතිවරණ නිරීක්ෂකයින්ද ඇතුළුවසිවිල් සමාජය**

ශ්‍රී ලංකාවේ දේශපාලන සහ මැතිවරණ ක්‍රියාවලීන්ට සිවිල් ක්‍රියාකාරීන්ගේ ඉහළ දායකත්වයක් ලැබේ. නොවැම්බර් 16 වන දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ගත් කළ, ඡන්ද දායකයින් දැනුවත් කිරීම, මාධ්‍ය නිරීක්ෂණය සහ මැතිවරණ නිරීක්ෂණය ආදී ක්‍රියාකාරකම් වල නියැලීමට පුරවැසි කණ්ඩායම් සැලැසුම් කර තිබේ. ඔක්තොම්බර් 5 වන දින පැවැති බහු පක්ෂ ජනාධිපතිවරණ අපේක්ෂකයින්ගේ සංවාදයද ඇතුළුව, පුරවැසියන් සමඟ සුවිශේෂී ප්‍රතිපත්තිමය යෝජනාවන් මත පදනම්ව ස්වකීය මැතිවරණ ව්‍යාපාරයන් පවත්වාගෙන යන ලෙසට ජනාධිපතිවරණ අපේක්ෂකයින්ට සහ දේශපාලන පක්ෂ දිරිමත් කිරීමද සිවිල් සමාජ සංවිධාන මඟින් කරනු ලබයි. මැතිවරණ නිරීක්ෂණ ආයතනයන් විසින් පෙන්වා දෙන ලද්දේ ඔවුන් දිගු කාලීනස හ කෙටි කාලීන නිරීක්ෂණයන් අනුයුක්ත කිරීමේ අරමුණු සහිතව මෙම මැතිවරණය නිරීක්ෂණය කිරීම සඳහා සැලැසුම් සකස් කර ඇති බවයි.

**නිර්දේශයන්**

පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය දක්වා සහ ඉන් පසුවද සලකා බැලීම සඳහා පහත සඳහන් නිර්දේශයන් දූත පිරිස විසින් ඉදිරිපත් කරනු ලබයි.

**මැතිවරණ කොමිෂන් සභාව**

- ඡන්ද දායකයින්ගේ දැනුම ඉහළ නැන්වීමේ ස්වකීය වැඩ පිළිවෙල යටතේ, ශ්‍රී ලංකාව මනාප ඡන්ද ක්‍රමයට අනුකූලව දෙවන සහ තෙවන මනාපය සලකුණු කරන ආකාරය පිළිබඳව ඡන්ද දායකයින්ව දැනුවත් කළයුතුය.
- මනාප ඡන්ද ක්‍රමයද ඇතුළුව, ඡන්දය දැමීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ වලට සහ සිවිල් සමාජ සංවිධාන වලට ජනතාව දැනුවත් කිරීමට ඉඩ ප්‍රස්ථාව සලස්වමින් කල්වේලා සහිතව ආකෘති ඡන්ද පත්‍රිකා ප්‍රසිද්ධ කළයුතුය.
- පලමු වටයේ මනාප ඡන්ද ගණන් කිරීමේදි කිසිඳු ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු නියත බහුතරයක් ලබා නොගැනීමට ඉඩප්‍රස්ථාව ඇති පසුබිමක, මනාප ඡන්ද සලකුණු කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් සියලුම මැතිවරණ නිලධාරීන්ට සහ ඡන්ද ගණන් කිරීමේ නිලධාරීන්ට ප්‍රමාණවත් පුහුණුවක් ලබා දෙන බව තහවුරු කළයුතුය.
- තමන්ගේ ඡන්දය සඳහා ලියාපදිංචි වී ඇති ස්ථානයන් වෙත ගොස් ස්වකීය ඡන්දය භාවිතා කිරීම සඳහා සේවා නියුක්තිකයන්ට අවශ්‍ය කාලය නීතියේ සඳහන් ආකාරයට ලබා දීම සඳහා සේවා යෝජකයින්ව දිරිමත් කළයුතුය.
- ඡන්දය දැමීම සඳහා සමාන ප්‍රවේශයක් ඇති බව තහවුරු කිරීමටත් සහ ප්‍රචණ්ඩත්වය සහ බිය වැද්දවීම් සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීමටත් සහ දෙමළ භාෂාව කතා කරන ප්‍රජාවක් සිටින ප්‍රදේශ සඳහා දෙමළ භාෂාව කතා කළ හැකි පොලිස් නිලධාරීන්ව අනුයුකුත් කිරීම ආදී තත්ත්වයන් සහතික කිරීම සඳහා අවධානම් සහිත ප්‍රදේශයන්ට මැතිවරණ නිරීක්ෂකයින් යොදවන්න.

*කාන්තාවන්ගේ සහභාගීත්වය සහ තරුණයින්*

- කාන්තාවන් හා තරුණයින් ඉලක්ක කරගත් ඡන්ද දායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ඉහළ දැමීම සහ ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත් වන සියයට 70ක් පමණ වන ශ්‍රී ලංකිකයින් සම්බන්ධයෙන් ගත් කළ ඒ සෑම සියලු ඡන්ද දායකයෙකුගේම ඡන්දයට ඇති වටිනාකම පිළිබඳව සලකා මැතිවරණ ආරවුල් නිරවුල් කිරීමේ යාන්ත්‍රණයන්ට ඇති ප්‍රවේශය සහ ආබාධ සහිත පුද්ගලයන්ට ඇති ප්‍රවේශය සහ ඉහළ දැමීම සඳහා කටයුතු කළයුතුය.
- ස්ත්‍රී පුරුෂ භාවය ජනවර්ගය, ආගම, ලිංගිකත්වය හෝ දේශපාලනික සම්බන්ධතාවය පිළිබඳව නොසලකා සියුලු පුරවැසියන්ගේ ආරක්ෂාව උදෙසා අපක්ෂපාතීවත් වෘත්තිය මට්ටමෙනුත් ස්වකීය රාජකාරී කටයුතු මෙහෙයවා මැතිවරණ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පොලිස් නිලධාරීන්ට අවශ්‍ය මාර්ගෝපදේශයන් ප්‍රසිද්ධ කළයුතුය.
- විශේෂයෙන්ම මුස්ලිම් ජනකොටස් වැඩි වශයෙන් කේන්ද්‍රගත වූ ප්‍රදේශ පිළිබඳව සලකා බලමින්, ආරක්ෂක කපොලු සහ ඡන්ද මධ්‍යස්ථානයන් සඳහා වැඩි වශයෙන් කාන්තා පොලිස් නිලධාරීන් සහ මැතිවරණ නිලධාරීන් යෙදවීම සඳහා අවශ්‍ය තරම් බඳවා ගැනීම් සහ පුහුණු කිරීම කළයුතුය.
- ක්‍රියාකාරී ජාතික මට්ටමේ තරුණ සංවිධාන සමග ඇති සම්බන්ධතාවයන් ශක්තිමත් කරමින් තරුණ ජනකොටස්වල සහභාගීත්වය වර්ධනය කළයුතුය.

**මාධ්‍ය**

- විශේෂයෙන්ම සියලු අපේක්ෂකයින් සම්බන්ධයෙන් සදාචාරත්මක, සාධාරණ සහ අපක්ෂපාතී මාධ්‍ය ආවරණයක් ලබා දීම සඳහා මැතිවරණ කොමිසම විසින් ලබාදී ඇති මාර්ගෝපදේශයන් රාජ්‍ය සහ පුද්ගලික මාධ්‍යයන් විසින් අනුගමනය කළයුතුය.
- මැතිවරණ කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණයෙන් ඡන්ද දායකයින්ගේ මාධ්‍ය සාක්ෂරතාවය දියුණු කිරීම සඳහා මනාප ඡන්ද සලකුණු කිරීමද ඇතුළුව ඡන්දය ලබාදීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පුරවැසියන්ව දැනුවත් කිරීම සඳහා අදාල රාජ්‍ය සේවා නිවේදන රාජ්‍ය මාධ්‍ය තුලින් ප්‍රසිද්ධ කළයුතුය.
- දිගු කාලීන වශයෙන් මැතිවරණ ක්‍රියාවලියද ඇතුළුව, ආචාර ධර්ම වලට අනුකූලව කයුතු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය මාර්ගෝපදේශනය සම සුපරීක්ෂණය සඳහා ස්වාධීන වූත් ඒකාබද්ධ වූත් ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා මාධ්‍ය ආයතන මගින් සලකා බැලිය යුතුය.

**ප්‍රචණ්ඩත්වය සහ වෛරී කථනය පාලනය කිරීම උදෙසා ඒකාබද්ධ වැඩපිළිවෙළ**

- ප්‍රචණ්ඩත්ව වර්ධනය වීමේ තත්ත්වයන් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂම, මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් සහ අන්තර් ආගමික සහ අන්තර් වාර්ගික කණ්ඩායම් අතර සංවාදයන්ට දායක වී ඇති පුරවැසි සංවිධාන විසින් මැතිවරණ කාල පරාසය ක්‍රියාකාරී ලෙස නිරීක්ෂණය කළ යුතුය.
- සාවද්‍ය තොරතුරු, අසත්‍ය ප්‍රචාර සහ වෛරී කථනයන් සම්බන්ධයෙන් සහ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය (අන්තර්ජාලය ද ඇතුළුව) මෙන්ම සමාජ මාධ්‍ය ජාලා හරහා සිදුවන පරිභව කිරීම් පිළිබඳව නිරීක්ෂණය කිරීමට සහ වාර්තා කිරීමට මැතිවරණ කොමිසම සහ සිවිල් සමාජය එකාබද්ධව කටයුතු කළයුතුය.
- වෛරී කථනයන් අනාවරණය කරගැනීම සඳහා සහ සාවද්‍ය තොරතුරු, අසත්‍ය ප්‍රචාර සහ වෛරී කථනයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකාරී ලත් ආයතන, දේශපාලන පක්ෂ සහ පුරවැසි සංවිධාන විසින් වාර්තා කරනු ලබන්නා වු සිද්ධීන් වලට පිළියම් යෙදීම සඳහා සුදුසු වන සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් සකසා ගැනීම උදෙසා රජය, සිවිල් සමාජය සහ සමාජ මාධ්‍ය ජාල සමාගම් එකාබද්ධව ක්‍රියා කළයුතුය.

**දේශපාලන පක්ෂ සහ මැතිවරණ අපේක්ෂකයින්**

- මැතිවරණ ක්‍රියාවලියේ විනිවිධභාවය ඉහළ නැංවීමට සහ දැන උගත් අයුරින් ඡන්දය භාවිතා කිරීම සඳහා පුරවැසියන්ට බලගැන්වීම උදෙසා ජනාධිපතිවරණ අපේක්ෂකයින් විසින් මැතිවරණ කොමිසමට භාර දෙන ලද වත්කම් සහ බැරකම් ප්‍රකාශ ප්‍රසිද්ධ කළයුතුය.
- කලාපිය වශයෙන් ඇති හොඳ පරිචයන්ට අනුකූල වන්නා වූත් සහ සාවද්‍ය තොරතුරු, අසත්‍ය ප්‍රචාර හා වෛරී කථනයන් මැඩපැවත්වීමට උපකාරී වන්නා වූත් බහු පක්ෂ ආචාර ධර්ම පද්ධතියක් සඳහා ශ්‍රී ලංකාවේ සියලු දේශපාලන පක්ෂ එකඟ විය යුතුය. එම ආචාර ධර්ම පද්ධතියට පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතුය.

  අ). ශ්‍රී ලංකා පුරවැසියන්ගේ ලැදියාවන්, ගැටළු සහ අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිචාර දක්වන්නා වූත්, සහ ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්න සම්බන්ධයෙන් එකඟතාවයන් ගොඩනඟා ගැනීම ප්‍රවර්ධනය කරන්නා වූත් විකල්ප ප්‍රතිපත්ති දියුණු කිරීමට කැපවීමක් විය යුතුය.

ආ). කාන්තාවන්, තරුණයින්, ආගමික සහ ජනවාර්ගික සුළුතර කණ්ඩායම්, ආබාධ සහිත පුද්ගලයින් සහ LGBTI ප්‍රජාවන්ට අදාළ ප්‍රතිපත්ති සැකැසීම, නියෝජනය සහ සංවිධානගත වීම සඳහා අර්ථාන්විතව ඔවුන් අන්තර්ගත කිරීම සඳහා යාන්ත්‍රණයක් සැකසිය යුතුය.

ඇ). දේශපාලන පක්ෂ වල පත්‍රිකාවන්, පුවත් පත්‍රිකාවන්, දැන්වීම්, ඕනෑම මාධ්‍යයක් ඔස්සේ විකාශය වන දේශපාලනික තොරතුරු මෙන්ම දේශපාලනික ජන රැලි වලදී අපහසාත්මක, කුපිත කරවන සුළු හෝ ගැටුම් ඇතිකරන, හෝ වෙනත් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට තර්ජනය කෙරෙන හෝ කිසිඳු ආකාරයකින් ප්‍රචණ්ඩත්වය ඉස්මතු කෙරෙන තත්ත්වයන් ඇති නොවීම තහවුරු කළයුතුය.

ඈ) පක්ෂග්‍රාහී ප්‍රයෝජනය සඳහා රාජ්‍ය දේපල භාවිතා නොකිරීමට කැපවීමක්ඃ සහ

ඉ) ආචාර ධර්ම පද්ධතිය උල්ලංඝණය කිරීමකදී ඒ සම්බන්ධයෙන් නිසි වේලාවට විනිවිධභාවයකින් යුක්තව පියවර ගැනීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සැකසිය යුතුය.

**පාර්ලිමේන්තුව (පශ්චාත් මැතිවරණ සමය)**

- දේශීය හා විදේශීය වශයෙන් දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින්ට ලැබෙන ආධාර මෙන්ම වියදම්ද නියාමනය කිරීම තුලින් මැතිවරණයන්හි විනිවිදභාවය ඉහළදැමීම, සියලු දෙනා අන්තර්ගතවීම තහවුරු කිරීම සඳහා සුදුසු පරිදි මැතිවරණ වියදම් වලට අදාළ නීති සැකැසීම.දේශපාලන පක්ෂවල ප්‍රතිලාභ සඳහා රාජ්‍ය දේපල අවභාවිතා කිරීම සම්බන්ධයෙන් වගවීම තහවුරු කිරීම උදෙසා අවශ්‍ය පරිදි නෛතික රාමුව ශක්තිමත් කළයුතුය.
- මැතිවරණ දිනය වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ කරන පුරවැසියන්ට ලියාපදිංචි කිරීම සහ ඔවුන්ට ඡන්දය භාවිතා කිරීමට ඉඩකඩ සැලැසීම සහ විදේශගතව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්ට ඡන්දය භාවිතා කිරීම සඳහා සුදුසු යාන්ත්‍රනයක් සැකසීම සිදු කළයුතුය.

**සිවිල් සමාජය**

- විශේෂයෙන්ම මනාප ඡන්ද භාවිතා කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ඡන්ද දායක දැනුම වැඩිකිරීම සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශය සහ අනුග්‍රහය දැක්වීමට කටයුතු දියත් කළයුතුය.
- ඡන්ද මධ්‍යස්ථාන සඳහා ප්‍රවේශ වීමට ඇති ඉඩ ප්‍රස්ථාව ඉහළ නැංවීම උදෙසා ආබාධ සහිත පුද්ගලයින්ගේ සංවිධාන මැතිවරණ කොමිසම සමඟ එක්ව කටයුතු කළ යුතුයි මේ සඳහා දැනටමත් ලබාගත හැකිව තිබෙන සහයෝගයක් මත ආධරක ඡන්ද භාවිතය සහ ප්‍රවාහනය ආදී කරුණු නැවත සංවිධානගත කිරීම සහ එකී ක්‍රියාවලිය අදාළ සහයෝගය අවශ්‍ය කරන්නා වූ සියලු ඡන්ද දායකයින් සඳහා පැහැදිළි, පහසු සහ නිශ්චිතව ලබාගත හැකි පරිදිතහවුරු කිරීම.
- පුරවැසි මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් විසින් ස්වකීය මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා නිරීක්ෂකයින් වශයෙන් කාන්තාවන් සහ තරුණයින්ව බඳවා ගැනීම ප්‍රමුඛතා ගත කළ යුතුය. තවද ඔවුන් විසින් ස්වකීය නිරීක්ෂණ කාර්යයන් සඳහා ආබාධ සහිත පුද්ගලයින් අන්තර්ගත කිරීම තවදුරටත් කළ යුතු සේම ආබාධ සහිත මැතිවරණ නිරීක්ෂකයින් සම්බන්ධයෙන් ඇති

ගැටළු විසඳාලීම සඳහා ආබාධ සහිත පුද්ගලයින්ගේ සංවිධාන සමඟ ඒකාබද්ධව කටයුතු කළ යුතුය.

- සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවන් තමන්ගේ ජාතික හැඳුනුම්පත්හි සඳහන් වන ස්ත්‍රී පුරුෂ භාවයන් සම්බන්ධයෙන් මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් මැතිවරණ අධිකාරීන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

**අන්තර්ජාතික ප්‍රජාව**

- ජනාධිපතිවරණය නිරීක්ෂණය කිරීම සඳහා කටයුතු කරනු ලබන දේශීය සහ විදේශීය නිරීක්ෂකයින්ට පූර්ණ සහය ලබා දෙන්න
- සියලු දෙනා අන්තර්ගත කිරීම. විනිවිදභාවය හා මැතිවරණ ක්‍රියාවලියෙහි වගවීම සම්බන්ධයෙන් නිසිපරිදි නීති ක්‍රියාත්මක කිරීම සඳහා මීට පෙර මැතිවරණයන්හිදී ලබා දෙන ලද නිර්දේශයන් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව සමඟ පසුවිපරම් කර බලන්න.

*අන්තර්ජාතික ජනරජ ආයතනය සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය වූ කලීආණ්ඩු පාලනය තුලපුරවැසි සහභාගීත්වය, විවෘතභාවය සහ වගවීම හරහා ලෝකය පුරාවට පැතිරී පවතින ප්‍රජාතන්ත්‍රවාදී දේශීය ආයතනයන් ශක්තිමත් කිරීමට සහ ඒවාට සහයෝගය ලබා දීම සඳහා කැප වූ අපක්ෂපාතී සංවිධානයන් වේ.*

*අන්තර්ජාතික ජනරජ ආයතනය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර www.iri.org වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය සම්බන්ධයෙන් වැඩිපුර තොරතුරු සඳහා කරුණාකර www.ndi.org වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.*

*මෙම දූත මෙහෙවරසඳහා සහයෝගය ලබාදුන් එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවට දූත පිරිස ස්වකීය කෘතඥතාවය පළ කර සිටී.*